# පරීක්ෂක වාර්තාව

## අදියර II විභාගය - 2022 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 25 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්නයකි. විෂය නිර්දේශය යටතේ උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය ආවරණය කරමින් දැනුම පරික්ෂා කර තිබේ. බොහෝ විභාග අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු ප්‍රමාණයම හෝ සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත්ව තිබේ.

පිළිතුරු ඇගැයීමේ දී නිරීක්ෂණය කළ පොදුවේ දක්නට තිබූ වැරදි සහ දුර්වලතා කිහිපයක් පහත දක්වා තිබේ:

**1.1.** යම් වත්කමක ධාරණ අගය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂාකොට තිබුණි. සැළකිය යුතු ශිෂ්‍ය පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, ඉතා සුළු සිසු පිරිසක් අවශ්‍ය ධාරණ අගය ගණනය කිරීමට අපොහොසත්ව තිබූ අතර, ක්ෂය අනුපාතය නිවැරදිව භාවිත කොට නොතිබිණි.

**1.2.** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 (LKAS 02) තොග සම්බන්ධ දැනුම පරික්ෂා කර තිබූ අතර, අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු ලබා දී තිබුණි.

**1.3.** දෙන ලද තොරතුරු මත පදනම්ව වත්කමක ක්ෂය කළහැකි අගය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරික්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව ප්‍රශ්නය සඳහා උත්සාහ කොට නිවැරදි පිළිතුරු සපයා තිබුණි. සමහරු වත්කම මත ක්‍ෂය කළ හැකි අගය වෙනුවට වැරදි සහගත ලෙස ක්‍ෂය ප්‍රමාණය දක්වා තිබුණි.

**1.4.** පිරිවැය ගිණුම්කරණයේ අරමුණ ප්‍රශ්න මගින් පරික්ෂා කර තිබුණි. පොදුවේ ගත්කල සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් පිරිවැය ගිණුම්කරණයේ අරමුණ නිවැරදි ලෙස හඳුනා ගෙන තිබූ අතර, සෙසු පිරිස බලාපොරොත්තු වූ පිළිතුර සැපයීමට අපොහොසත් වී තිබුණි.

**1.5.** අමුද්‍රව්‍ය 'A' හි යලි ඇනවුම් මට්ටම පිළිබඳ ප්‍රශ්නය මගින් පරික්ෂා කොට තිබුණි. බහුතර අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය සඳහා නිවැරදි තොරතුරු සපයා තිබුණි.

**1.6.** හවුල්කරුවෙකු සැපයූ ණය සඳහා පොලිය, හවුල් ගිවිසුම, හවුල් වේතනය ආදිය පිළිබඳ 1890 හවුල් ආඥා පනතේ සඳහන් විධිවිධාන සම්බන්ධව අයදුම්කරුවාගේ දැනුම පරීක්ෂාවට ලක් කෙරිණි. බහුතර අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

**1.7.** දෙන ලද නිර්ණායකයන් තුළ පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් දැක්වීම අවශ්‍ය කෙරිණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වී තිබුණි.

**1.8.** හවුල් ගිවිසුමෙහි අන්තර්ගත විය යුතු කරුණු තුනක් සඳහන් කිරීම අවශ්‍ය වුණි. බහුතර අයදුම්කරුවන් 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියෙහි සඳහන් දෑ පිළිතුරු ලෙස ලබාදී තිබුණි.

**1.9.** ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) ගණනය කිරීම අපේක්ෂා කොට තිබුණි. VAT සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම සතුටුදායක මට්ටමකින් පැවැත්වුවද, මෙම අදියරෙහි අයදුම්කරුවෙකුගේ ගණිතය සම්බන්ධ දැනුම මෙවන් ගණනය කිරීමක් සඳහා තවදුරටත් වර්ධනය විය යුතුය.

**1.10.** කාර්යයක් මත අගය කළ යුතු මිල ගණනය කිරීම අවශ්‍ය කෙරිණි. පිරිවැය මත 20% ක ලාභය ගණනය කිරීමට සමහරු අපොහොසත් වී තිබිණි. තවද, පොදුකාර්ය පිරිවැයෙන් 75% ක් ගණනය කිරීමට සමහර අයදුම්කරුවන් අපොහොසත් වී තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

කේවලස්වාමි ව්‍යාපාරයක දී ඇති අසම්පූර්ණ මූල්‍ය තොරතුරු භාවිත කරමින් ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම මෙම ප්‍රශ්නය මඟින් පරීක්ෂාවට ලක් කොට තිබිණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා සාර්ථකව පිළිතුරු සපයා තිබූ අතර, මුළු ලකුණු සංඛ්‍යාව ලබාගෙන තිබුණි. අනෙකුත් අයදුම්කරුවන්ට සිද්ධාන්ත කරුණු පිළිබඳව තිබෙන දැනුමේ ඌණතාවය හේතුවෙන් දෙන ලද ගැලපිලි විසඳාගැනීමට නොහැකි වී තිබුණි. තවද, සමහර අයදුම්කරුවන් ආරම්භක ප්‍රාග්ධනය නිසි ලෙස ගණනය කිරීමට අපොහොසත් වූ අතර, ශේෂ පිරික්සුම් පිළියෙල කිරීම වෙනුවට ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කොට තිබුණි. සමහර අයදුම්කරුවන් විසින් ක්ෂයවීම සැලකිල්ලට ගෙන නොතිබිණි. ඉදිරියට ගෙවන ලද කුලී වියදම නිසි ලෙස ශේෂ පිරික්සුම තුළ දක්වා නොතිබිණි. අයිතිකරුගේ පුද්ගලික මුදලින් ව්‍යාපාරයේ පරිභෝජනය පිණිස මිලට ගෙන තිබූ වත්කමක් ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් ගැනිලි ලෙස හඳුනාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මඟින් හවුල් ව්‍යාපාර ගිණුම්කරණය සම්බන්ධ මූලික දැනුම පරීක්ෂා කොට තිබුණි. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් පිළියෙල කිරීම අපේක්ෂා කෙරිණි. හවුල් ව්‍යාපාර ගිණුම්කරණ සම්බන්ධව මූලික දැනුමෙහි ඌනතාවයන් නිරීක්ෂණය විය. ප්‍රාග්ධන ගිණුමෙහි සහ ජංගම ගිණුමෙහි තබන සටහන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් විභාග අයදුම්කරුවන්ට නොතිබුණි.

පොදුවේ නිරීක්ෂණය කළ වැරදි පහත පරිදි වේ:

- සමහර අයදුම්කරුවන් විසින් කීර්තිනාමය සහ වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තයන් ප්‍රාග්ධන ගිණුමේ ගලපනවා වෙනුවට ජංගම ගිණුමේ ගලපා තිබුණි.
- ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් ප්‍රාග්ධනය මත පොළී හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ ගලපා තිබුණි.
- විශ්‍රාම යන හවුල්කරුට ගෙවිය යුතු ශේෂය නිවැරදිව ගණනය කොට ප්‍රාග්ධන ගිණුම් තුළ පෙන්වා නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් විසින් ගැනිලි ප්‍රාග්ධන ගිණුම් තුළ ඇතුළත් කොට තිබේ.

- සමහර අයදුම්කරුවන් විසින් දැනට සිටින හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වල අවසාන ශේෂයන් ප්‍රාග්ධන ගිණුම්වලට මාරුකොට තිබුණි.
- ප්‍රාග්ධනය මත පොළී ප්‍රාග්ධන ගිණුමෙහි සටහන් කොට තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

ලාභ අරමුණු කර නොගත් සංවිධානයක සාමාජික ගාස්තු ගිණුම පිළියෙළ කිරීම සහ ආදායම් සහ වියදම් ගිණුම් පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය මඟින් පරීක්ෂා කරන ලදී.

පොදුවේ නිරීක්ෂණය කළ වැරදි පහත පරිදි වේ:

(1) සමහර අයදුම්කරුවන් සාමාජික ගාස්තු ගිණුම නිවැරදිව පිළියෙල කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්සාහ කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් ගිණුමේ වැරදි පැත්තේ ගනුදෙනු සටහන් කොට තිබුණි.

(2) සාමාජික ගාස්තු ගිණුම නිවැරදිව පිළියෙල කොට නොතිබුණු අතර, හර සහ බැර සටහන් නිසි පරිදි හඳුනාගෙන නොතිබුණි.

(3) සමහර අයදුම්කරුවන් සාමාජික මුදල කපා හැරීම සාමාජික ගිණුමේ නොතිබුණු අතර සමහරු සමස්ත වටිනාකම ආදායම් හා වියදම් ගිණුම තුළ පෙන්වා නොතිබුණි.

(4) සමහර අයදුම්කරුවන් හට ආරම්භක හා අවසාන ශේෂයන් සාමාජික ගාස්තු ගිණුමේ කුමන පැත්තේ සටහන් කරනවාද යන්න පිළිබඳව අවබෝධයක් නොතිබුණු අතර සමහරු සාමාජික ගාස්තු ගණනය කරන්නේ කෙසේද යන්න හඳුනාගෙන නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් මිලදී ගත් ලැප්ටොප් පරිගණකය මත ක්ෂය වීම හඳුනා නොගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත අගය ආදායම් හා වියදම් ගිණුම තුළ පෙන්වා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

### (A) කොටස

මෙම ප්‍රශ්නය මඟින් සමාගමක නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන සහ සේවා පිරිවැය මධ්‍යස්ථාන හඳුනා ගන්නේ කෙසේද යන්න පරීක්ෂා කොට තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. නමුත් එය නිවැරදිව හඳුනා නොගත් සියලු සිසුන් ලකුණු අහිමි කරගෙන තිබුණි.

### (B) කොටස

අමුද්‍රව්‍ය පාලන ගිණුම සහ නොහිමි වැඩ පාලන ගිණුම පිළියෙල කරන්නේ කෙසේද යන්න මෙම ගැටලු මඟින් පරීක්ෂා කොට තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ගැටලුව සඳහා නිවැරදි පිළිතුර ලබා දී නොතිබූ අතර බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය සඳහා උත්සාහ කිරීමෙන්ද වැලකී තිබුණි. එමෙන්ම ගිණුමක් ඉදිරිපත් කරනවා වෙනුවට ඔවුහු ප්‍රකාශනයක් පිළියෙල කර තිබූ අතර සමහර සිසුන් ගණිතමය ක්‍රමය පමණක් භාවිතා කොට තිබුණි. ඒ අනුව පිරිවැය ගිණුම්කරණයේ මෙම කොටස සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කෙරිණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

**(A) කොටස**

මෙම ප්‍රශ්නය මඟින් නිෂ්පාදන සමාගමක වාර්ෂික ඉල්ලුම සහ අමුද්‍රව්‍යවල ආර්ථික ඇනවුම් ප්‍රමාණය පිළිබඳ පරීක්ෂා කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් විසින් වාර්ෂික ඉල්ලුම නිවැරදිව ගණනය කොට තිබුණද, වාර්ෂික ඇනවුම් ප්‍රමාණය නිවැරදිව ගණනයකොට නොතිබුණි. මෙහිදී සමහර අයදුම්කරුවන් පිළිතුරු ග්‍රෑම් වලින් ලබාගෙන තිබු අතර එය කිලෝ ග්‍රෑම් වලට පරිවර්තනය කොට නොතිබුණි. එමෙන්ම ආරම්භයේදි ලබාගෙන තිබූ වාර්ෂික ඉල්ලුම සමීකරණය සඳහා නිවැරදිව ආදේශකොට නොතිබීමද දක්නට ලැබුණි.

**(B) කොටස**

වැටුප් සහ දීමනා වලින් සමන්විත වූ සේවකයෙකුගේ ඉපයීම් ගණනය කිරීම මෙම ගැටළුව මඟින් පරීක්ෂාවට ලක්කොට තිබුණි. බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ලබා දීමට අපොහොසත් වූ අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු දීමනා ගණනය කරන අවස්ථාවේදී පැවති ඒකක ගණන පමණක් ගණනය කොට තිබුණි. එම නිසා ඉතිරි ගණනය කිරීම් වැරදිවූ අතර ලකුණු අහිමිවුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය මඟින් සීමිත පුද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධව පරීක්ෂා කොට තිබුණි. එමෙන්ම **(a) කොටස** සහ **(b) කොටස** යනුවෙන් කොටස් දෙකක් මෙම ප්‍රශ්නය තුළ දක්නට තිබුණි. **(a) කොටස** මඟින් විස්තීරණ ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කිරීමත් **(b) කොටස** මඟින් මූල්‍ය තත්ව ප්‍රකාශනයක් පිළියෙල කිරීමත් පරීක්ෂා කොට තිබුණි.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්සාහ කොට තිබුනද ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ප්‍රමාණය රැස්කරගෙන තිබුණි

පොදුවේ නිරීක්ෂණය කරන සමහර පොදු වැරදි පහත දැක්වේ:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) බොහෝ අයදුම්කරුවන් අවසාන තොග ගැලපීම නිවැරදිව ගලපා නොතිබුණි. තොග සඳහා වන නව ගිණුම්කරණ ප්‍රමිත යටතේ තොග හානිවීම් නිසි පරිදි සැලකිල්ලට ගෙන නොතිබිණි. ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

(2) බහුතර අයදුම්කරුවන් ආදායම් බදු ගැලපීම ඔවුන්ගේ ගැලපීම් යටතේ පෙන්වා නොතිබූ අතර බොහෝ අයදුම්කරුවන් සලකා බලන වර්ෂය සඳහා නිවැරදිව ආදායම් බද්ද ගණනය කොට නොතිබුණි.

(3) බොහෝ අයදුම්කරුවන් ණයකර පොළිය නිවැරදිව ගණනය කොට තිබුණි. ඔවුන් වාර්ෂික පොළිය ගණනය කොට නොතිබූ අතර ගෙවන ලද ණයකර පොළිය පමණක් සැලකිල්ලට ගෙන තිබුණි.

(4) බොහෝ අයදුම්කරුවන් රු.17,970/- ක බොල් ණය ආදයම් ප්‍රකාශනයේ සැලකිල්ලට ගෙන තිබුණද, අඩමාන ණය ඌන වෙන් කිරීම නිවැරදිව ගණනය කොට නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් විසින් මූල්‍ය ප්‍රකාශනවල උපචිත ගෙවීම් නිසිපරිදි පෙන්වා නොතිබුණි.

(6) සමහර අයදුම්කරුවන් පෙර වැඩ අමුණා නොතිබූ බැවින් ලකුණු ස්වල්පයක් අහිමි කොටගෙන තිබුණි.

(7) සමහර අයදුම්කරුවන් ක්‍ෂය වීම නිවැරදිව ගණනය කොට නොතිබුණි.

(8) පරිපාලන වියදම් හා බෙදාහැරීමේ වියදම්වලට අදාල සවිස්තරාත්මක පෙරවැඩ සමහර අයදුම්කරුවන් අමුණා නොතිබූ බැවින් යම් ලකුණු ප්‍රමාණයක් ඉපයීමට ඔවුන් අසමත්ව තිබුණි.

(9) සමහර අයදුම්කරුවන් විසින් සමහර ඉලක්කම් රුපියල් දහස්වලින් පෙන්වා තිබූ අතර සමහර ඉලක්කම් දහස්වලට වැටයීමකින් තොරව ගෙන තිබුණි. එම නිසා වාර්තාකරන ලද සංඛ්‍යාවන්හි පැවති වැරදි සහගත බව හේතුවෙන් සමහර අයදුම්කරුවන් ලකුණු ඉපයීමට අපොහොසත් විය.

(10) බොහෝ අයදුම්කරුවන් ශුද්ධ ලාභය සඳහා දෙන ලකුණු ප්‍රමාණයන් අහිමිකොටගෙන තිබුණි. ඔවුහු බොහෝ දෙනා අවම වශයෙන් එක් හෝ වරදක් හේතුවෙන් ශුද්ධ ලාභය වරදවා ගෙන තිබුණි.

**(b) මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) උපචිත ණයකර පොළිය උපචිත විදුලිය හා ආදායම් බදු ප්‍රතිපාදනය නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කොට නොතිබිණි.

(2) සමුච්චිත ක්‍ෂය ප්‍රමාණය නිවැරදිව සඳහන් නොකිරීම හේතුවෙන් සමහර අයදුම්කරුවන් අඩු ලකුණු ප්‍රමාණයක් වාර්තා කර තිබුණි.

(3) බොහෝ අයදුම්කරුවන් ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය නිවැරදිව පෙන්වා නොතිබුණි.

(4) වත්කම් මත ක්ෂය නිවැරදිව පෙර වැඩ වලදී ගණනය කර තිබුණත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදි ස්ථානයේ සටහන් කිරීමට සමහර අයදුම්කරුවන් අපොහොසත් වී තිබිණි,

(5) සමහර අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු ණයකර පොළිය ණයකර වටිනාකමට එකතු කොට දිගුකාලීන වගකීම් යටතේ ගිණුම් ගත කොට තිබුණි.

(6) බොහෝ අයදුම්කරුවන් හානි වූ තොගය අවසාන තොගයෙන් අඩු කොට නොතිබුණි.

(7) බොහෝ අයදුම්කරුවන් බොල් ණය ප්‍රමාණය වෙළඳ ලැබිය යුතුදෑ වලින් අඩු කොට නොතිබූ අතර අඩමාන ණය සඳහා වෙන්කිරීම පමණක් වෙළඳ ලැබිය යුතු දෑ වලින් අඩු කොට තිබුණි.

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

- * * * -